**පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව - උතුරු මැද පළාත**
**උතුරු මැද පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III වැනි ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2018**

---

1.0 උතුරු මැද පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ පවතින පුරප්පාඩු පිරවීම සඳහා උතුරු මැද පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III වන ශ්‍රේණියේ තනතුරුවලට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2019 පෙබරවාරි මස දී පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. මෙම විභාගය අනුරාධපුරය හා පොළොන්නරුව යන නගර වලදී පැවැත්වේ. එබැවින් විභාගයට පෙනී සිටීමට අයදුම්කරු අපේක්ෂා කරන නගරය හා ඊට අදාළ පහත සඳහන් නගර අංකය අයදුම්පතෙහි සඳහන් කළ යුතුය.

| නගරය | නගර අංකය |
|---|---|
| අනුරාධපුරය | 01 |
| පොළොන්නරුව | 02 |

2.0 පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵලවල කුසලතා අනුපිළිවෙල මත සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයින් දිස්ත්‍රික් ජනගහන අනුපාතය පදනමින් උතුරු මැද පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III වන ශ්‍රේණියේ තනතුරු සඳහා පත් කිරීමට තෝරාගනු ඇත.

3.0 (අ) පත්කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මක වන දිනය පත්වීම් බලධරයා විසින් නිශ්චය කරනු ලැබේ. කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ලම හෝ පිරවීමට හෝ නොපිරවීමට උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත බලය ඇත. අයදුම්පත් කැඳවන අවසාන දිනට පවතින පුරප්පාඩු සංඛ්‍යාව 71 කි.

(ආ) උතුරු මැද පළාත් රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද, 2014.07.15 දිනැති උතුරු මැද පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ පනවා ඇති නියමයන් හා කොන්දේසිවලට ද,එම ව්‍යවස්ථාවට කර ඇති හෝ මින්මතු කෙරෙන සංශෝධනවලට ද, ආයතන සංග්‍රහයේ හා මුදල් රෙගුලාසි විධිවිධානවලටද යටත්ව තෝරාගනු ලබන අපේක්ෂකයෙකු කළමනාකරණ සහකාර සේවයේ **III** ශ්‍රේණියට පත් කරනු ලැබේ.

(ඇ) මෙම පත්වීම අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වේ. උතුරු මැද පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ **III** වන ශ්‍රේණියට බඳවා ගෙන වසර 03 ක් ඇතුළත සේවා ව්‍යවස්ථාවේ සඳහන් පරිදි පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතු ය.

(ඈ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014 ට අනුව හා ඊට අනුශාංගික චක්‍රලේඛ අනුව තනතුරට පත්වීමෙන් වසර 05 ක් ඇතුළත නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා ගත යුතු ය.

4.0 වැටුප:- අංක 03/2016 හා 2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව, උතුරු මැද පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයට අදාළ මාසික වැටුප් පරිමාණය (MN 2-2016) රු.28,940 - 10x300 – 11x350 -10x560 - 10x660 - 47,990 ක් වන අතර එම වැටුප හිමි වන්නේ 2020.01.01 දින සිට වේ. ඉහත චක්‍රලේඛයේ උපලේඛන II හි විධිවිධාන පරිදි පත්වීම ක්‍රියාත්මක වන දින සිට වැටුප් ගෙවනු ලැබේ. රු. 31,940 න් ඔබ්බට යාම සඳහා II වන ශ්‍රේණියට උසස් වීම ද, රු. 35,790 න් ඔබ්බට යාම සඳහා I වන ශ්‍රේණියට උසස් වීම ද ලබා ගත යුතුය. මීට අමතරව අනුමත ජීවන වියදම් දීමනාව හා අනෙකුත් අනුමත දීමනා ද ගෙවනු ලැබේ.

5.0 මෙම තනතුර ස්ථිරය. තනතුරට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණවලට පත්වීම්ලාභීන් යටත්විය යුතු වේ.

6.0 සුදුසුකම්:- උතුරු මැද පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ **III** වන ශ්‍රේණියේ තනතුරුවලට බඳවා ගැනීම සඳහා පහත සඳහන් සුදුසුකම් අදාළ වේ.

(අ) ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය. තවද උතුරු මැද පළාත තුළ වසර 3 ක අඛණ්ඩ ස්ථිර පදිංචිකරුවකු විය යුතුය.

(ආ) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට (2018.12.26.) වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 30ට නොවැඩි විය යුතුය. (දැනටමත් රාජ්‍ය සේවයේ/උතුරු මැද පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර සේවයේ නියුතු අයට උපරිම වයස් සීමාව අදාළ නොවේ. බඳවා ගනු ලබන අවස්ථාව වන විට උපරිම වයස් සීමාව ඉක්මවා නොසිටිය යුතුය)

(ඇ) අයදුම්කරු විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

(ඈ) සෑම අපේක්ෂකයෙකුම උතුරු මැද පළාත තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටුකිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

(ඉ) පහත සඳහන් අධ්‍යාපන සුදුසුකම්, අයදුම්පත් බාර ගන්නා අවසාන දිනට සම්පූර්ණ කර තිබිය යුතුය.

(1) සිංහල භාෂාව හෝ දෙමළ භාෂාව හෝ ඉංග්‍රීසි භාෂාව සහ ගණිතය ඇතුළුව විෂයයන් හතර(04) කට සම්මාන සාමාර්ථයන් සහිතව එක් වරකදී විෂයයන් හය(06) කින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.

සහ

(2) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී (සාමාන්‍ය පොදු පරීක්ෂණය හා සාමාන්‍ය ඉංග්‍රීසි හැර) විෂයයන් තුන(03)කින් එක්වරකදී සමත් ව තිබීම.

**සටහන: -** විෂයයන් 04 ක් සහිත වූ පැරණි විෂය නිර්දේශය යටතේ විෂයය 03කින් එකවර සමත්ව තිබීම ප්‍රමාණවත් වේ.

සැ. යු:- සෑම අයදුම්කරුවකුම තනතුරට අදාළ සියලු සුදුසුකම් 2018.12.26. වැනි දින හෝ ඊට පෙර හෝ සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

7.0 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 15/90 හා 15/90(i) හි විධිවිධාන අනුව සේවයට බඳවා ගැනීම නියෝජනාත්මක පදනමක් මත කෙරෙනු ඇත. උතුරු මැද පළාතට අයත් එක් එක් පරිපාලන දිස්ත්‍රික්කයක ජන සංඛ්‍යාවට සමානුපාතිකව එම එක් එක් දිස්ත්‍රික්කය සඳහා පුරප්පාඩු සංඛ්‍යාවෙන් නියමිත ප්‍රතිශතයක් වෙන් කරනු ලැබේ. යම් දිස්ත්‍රික්කයකින් පිරවිය යුතු පුරප්පාඩු සංඛ්‍යාව සඳහා තරඟ කිරීමට සුදුස්සන් වනුයේ එම දිස්ත්‍රික්කයෙන් ඉල්ලුම් කරන අයදුම්කරුවන් පමණි.

**සටහන: -**ලිඛිත විභාගයෙන් තේරී පත්වන අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයේ දී හෝ විමසන ඕනෑම අවස්ථාවක ඉහත දිස්ත්‍රික්කයට අයත්වීම සනාථ කිරීම සඳහා,

(I) අවුරුදු තුනක (03)අඛණ්ඩ පදිංචිය තහවුරු කෙරෙන ලියාපදිංචි ඡන්ද හිමි නාමලේඛන තොරතුරු හෝ ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කළ පදිංචි සහතිකය ඉදිරිපත් කළ යුතුය.

(11) පුරප්පාඩු සඳහා අයදුම් කිරීමට තෝරගනු ලබන දිස්ත්‍රික්කය හා ඊට අදාළ අනු අංකය පහත සඳහන් පරිදි අයදුම්පත්‍රයේ නිවැරදිව සඳහන් කළ යුතුය .

<u>දිස්ත්‍රික්කය</u> <u>දිස්ත්‍රික්ක අංකය</u>

| | |
|---|---|
| අනුරාධපුරය | 01 |
| පොළොන්නරුව | 02 |

8.0 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 27/88 අනුව පවත්නා පුරප්පාඩු සංඛ්‍යාවෙන් 3% ක් ආබාධ සහිත පුද්ගලයින් සඳහා වෙන් කෙරෙනු ඇත. විභාගයේ දී සුදුසුකම් ලබන ආබාධිත අයදුම්කරුවන් අතරින් ඉහළ ලකුණු මට්ටමේ 3% ක ප්‍රතිශතයක් පමණක් පත්වීම් ලබාදීම සඳහා තෝරා ගැනෙනු ඇත. ආබාධිත පදනම යටතේ තෝරා ගනු ලබන අපේක්ෂකයින්ගේ ලකුණු මට්ටම විභාගයේ මුළු ලකුණු ගණනින් යටත් පිරිසෙයින් 50% ක් වත් විය යුතුය.

**සටහන:-**අයදුම්පත්‍රයේ මුල්පිටුවේ මුදුනත අදාළ පරිදි තමා අබාධිත පුනරුත්ථාපන කොන්දේසි යටතේ අයදුම් කරන බව සඳහන් කළයුතු වේ.

9.0 විභාග පරිපාටිය :-

(අ) විභාගය ප්‍රශ්න පත්‍ර දෙකකින් යුක්ත වේ. මෙම විභාගය සිංහල හා දෙමළ මාධ්‍යවලින් පැවැත්වෙන අතර ඉල්ලුම්කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

| ප්‍රශ්න පත්‍රයේ නම | ලකුණු | කාලය |
|---|---|---|
| (1) භාෂා හැකියාව | 100 යි | පැය 2 1/2 යි |
| (2) අභියෝග්‍යතාව | 100 යි | පැය 1 යි |

(1) භාෂා හැකියාව - මෙම ප්‍රශ්න පත්‍රය අපේක්ෂකයින්ගේ අදහස් ප්‍රකාශනය, අවබෝධය, අක්ෂර වින්‍යාසය, භාෂාව හා රචනය, දෙන ලද ලිපියක් කෙටුම්පත් කිරීම, සපයා ඇති දත්ත අනුව ප්‍රස්ථාර වගු සකස් කිරීම, දී ඇති පාඨ සාරාංශ කිරීම, දී ඇති වාක්‍ය කීපයක අදහස් තනි වාක්‍යයකින් ලිවීම සහ සරල ව්‍යාකරණ භාවිතය පිළිබඳ දැනුම පරීක්ෂා කෙරෙන විෂයානුබද්ධ ප්‍රශ්නවලින් සමන්විත වේ.

(2) අභියෝග්‍යතාව- මෙම ප්‍රශ්න පත්‍රය අපේක්ෂකයින්ගේ සංඛ්‍යාමය හැකියාවන්, තර්කන ශක්තිය, සාමාන්‍ය බුද්ධිය මැන බැලීමට හැකිවන අයුරින් සැකසෙන ප්‍රශ්නවලින් සමන්විත වේ.

සටහන :

(I) රාජකාරි කටයුතු සඳහා අපේක්ෂකයින්ගේ සුදුසුකම් හා හැකියාව පරීක්ෂා කිරීම පිණිස මෙම ප්‍රශ්න පත්‍ර සකස් කෙරේ.

(II) පිළිතුරු ලිවීමේදී අපැහැදිලි අත් අකුරු හා වචනවල අක්ෂර වින්‍යාසය පිළිබඳ වැරදි සම්බන්ධයෙන් ලකුණු අඩු කරනු ලැබේ.

(ආ) මෙම විභාගය තරග විභාගයක් වුව ද පත්වීම් ලැබීමට සුදුසුකම් ලැබීම සඳහා එක් එක් විෂයය සඳහා වෙන් කර ඇති ලකුණුවලින් යටත් පිරිසෙයින් සියයට හතලිහක් වත් (40%) අපේක්ෂකයින් විසින් ලබා ගත යුතු වන අතර, විභාගයේ මුළු ලකුණු ගණනින් යටත් පිරිසෙයින් සියයට පනහක් වත්(50%) ලබා ගත යුතු වේ.

10.0 ව්‍යාජ තොරතුරු ඉදිරිපත් කිරීම :- අයදුම්පත්‍රය පිරවීමේ දී ඉතා සැළකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මේ විභාගයේ නීතිරීති අනුව යම් අපේක්ෂකයෙකු නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතරතුර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය. අයදුම්කරුවෙකු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් තෝරාපත්කර ගැනීමෙන් පසුව සේවයේ යෙදී සිටියදී වුවද ඕනෑම අවස්ථාවක අසත්‍ය බව තහවුරු වුවහොත් හෝ ඔහු/ඇය සේවයෙන් පහ කිරීමට යටත්වනු ඇත.

11.0 විභාග ගාස්තු :- විභාග ගාස්තුව රු: 600/-කි. එම ගාස්තුව උතුරු මැද පළාත තුළ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට මුදලින් ගෙවා ඒ සඳහා නිකුත් කරනුලබන කුවිතාන්සිය (NC100) අයදුම්පත්‍රයට අමුණා එවිය යුතුය. එම විභාග ගාස්තුව ගෙවිය යුත්තේ උතුරු මැද පළාත් පොදු තැන්පත් ගිණුමට බැර වන ලෙසය. ගෙවනු ලබන විභාග ගාස්තුව කවර හේතුවක් නිසාවත් ආපසු ගෙවනු නොලැබේ. මුදල් ගෙවා ලබාගන්නා කුවිතාන්සියේ ඡායා පිටපතක් මතු ප්‍රයෝජනය සඳහා අයදුම්කරු විසින් ළඟ තබා ගත යුතු වේ.

12.0 අයදුම්පත්‍ර :-ඒ 4(සෙ. මී. 21 X29) (සාමාන්‍ය හාෆ්ෂීට්) ප්‍රමාණයේ කඩදාසි භාවිතා කරමින්,

(අ) අංක 01 සිට 03 තෙක් ඡේදයන් පළමු පිටුවට ද,

(ආ) අංක 04 සිට ඉදිරියට වන ඡේදයන් අනෙක් පිටුවලට ඇතුළත් වන සේ අයදුම්පත්‍රය පිළියෙල කරගත යුතුය.

(ඇ) අයදුම්පත්‍රය පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසි බසින්ද , දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසි බසින්ද සඳහන් කළ යුතුය.

(ඈ) අයදුම්පත්‍රයේ 1.1 යටතේ අයදුම්කරුගේ නම සඳහන් කිරීමේ දී අයදුම්කරුගේ සම්පූර්ණ නමෙහි අගට යෙදෙන කොටස පළමුව ලියා, පෙළපත් නාමයට අදාළ නම්වල මුල'කුරු හා නමෙහි අනෙකුත් කොටස්වල මුල'කුරු ඊළඟට වන සේ ලිවිය යුතුය.

13.0 නියමිත ආදර්ශ ආකෘතියට අනුකූල නොවන, නියමිත දිනට පෙර විභාග ගාස්තු ගෙවා නොමැති, ප්‍රාදේශීය ලේකම් කාර්යාල හැර වෙනත් ආයතනවලට මුදල් ගෙවා ඇති, කුවිතාන්සියේ මුල්පිටපත අමුණා නොමැති හා නිවැරදිව සම්පූර්ණ කර නොමැති අසම්පූර්ණ අයදුම්පත්‍ර කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. නිසි පරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව සඳහා මෙම කොමිෂන් සභාව වගකියනු නොලැබේ. අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

I. මෙම පුවත්පත් නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නියමිත විභාග ගාස්තු ගෙවා නියමිත දිනට හෝ එදිනට පෙර හෝ අයදුම්පත්‍ර ඉදිරිපත් කර ඇති සියලු අයදුම්කරුවන්ට තරග විභාගයට පෙනී සිටීමට පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ඉඩ දෙනු ලැබේ.

II. දැනටත්මත් රාජ්‍ය සේවයෙහි නියුක්ත අයදුම්කරුවන් තම අයදුම්පත් ආයතන/දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශයද සහිතව තම ආයතතනය මඟින් යොමු කළ යුතුවේ.

III. තරග විභාගයට පෙනී සිටීම සඳහා ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සළකනු නොලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා පුවත්පත් නිවේදනය අනුව සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවේ අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් එම අයගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

IV. අයදුම්පත්‍රය බහා එවන කවරයේ වමත් පස ඉහළ කෙළවරේ **<u>"කළමනාකරණ සහකාර සේවයට බඳවා ගැනීම - 2018 "</u>** යන්න සහ **<u>අයදුම්කරු විභාගයට පෙනී සිටින දිස්ත්‍රික්කය</u>** ද සඳහන් කරන්න.

V. අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන, රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියෙකු, පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධාරියෙකු හෝ වාර්ෂික වැටුප රු. 395,520/= ක් හෝ ඊට වැඩි රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු හෝ විසින් සහතික කරනු ලැබ තිබිය යුතු ය. සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය 2018.12.26. වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ පහත දැක්වෙන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

ලේකම්,<br>
උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,<br>
දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරිශ්‍රය<br>
අනුරාධපුර

14.0 විභාගයට පෙනී සිටීම.- අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ වෙබ් අඩවියේ පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 2 ක් හෝ 3 ක් ගතවූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත දන්වා සිටිය යුතුය. එහිදී අයදුම්කරු වෙත තබාගත් අයදුම්පත්‍රයේ පිටපත, විභාග ගාස්තු ගෙවීමෙන් ලද කුවිතාන්සියේ පිටපත හා අයදුම්පත්‍රය තැපෑලෙන් යොමු කිරීමේදී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය ද සමඟින් විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය සඳහන් කරමින්, ෆැක්ස් මගින් ප්‍රවේශ පත්‍රයේ පිටපතක් ලබා ගැනීම සඳහා ෆැක්ස් අංකයක් ද හා ඉහත පරිදි අයදුම්කරුගේ විස්තර ඇතුළත් ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කරමින්ම විමසා සිටීම ද වඩාත් ප්‍රතිඵලදායී වනු ඇත. විභාගයට පෙනී සිටින සෑම අයදුම්කරුවෙකුම ප්‍රවේශ පත්‍රයේ තම අත්සන සහතික කරවා ගතයුතු අතර තමාට නියම කර ඇති විභාග මධ්‍යස්ථානයේ දී විභාගයට පෙනී සිටිය යුතුය. එසේ පෙනී සිටින පළමු අවස්ථාවේදීම විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතුය. එසේ ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අයදුම්කරුවෙකුට විභාගයට පෙනී සිටීමට අවසර නොලැබෙනු ඇත.

15.0 අපේක්ෂකයින්ගේ අනන්‍යතාව සනාථ කිරීම සඳහා පහත සඳහන් ලියවිලි වලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. :-

(1) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත,
(11) වලංගු විදේශ ගමන් බලපත්‍රය.
(111) වලංගු රියදුරු බලපත්‍රය

16.0 විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත්වන අතර එම නීතිරීති උල්ලංඝනය කළ හොත් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට අයදුම්කරුට සිදුවනු ඇත.

17.0 මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත්, ඒ සම්බන්ධව උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් තීරණය කරනු ඇත. සියලුම අයදුම්කරුවන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ සඳහන් පොදු විභාග නීතිරීති අනුව කටයුතු කිරීමට ද බැඳී සිටිනු ඇත.

18.0 විභාගය පැවැත්වෙන දිනය පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් යථා කාලයේදී දැනුම් දෙනු ඇත.

19.0 මෙහි සිංහල හා දෙමළ මාධ්‍ය නිවේදන අතර කිසියම් අනනුකූලතාවයක් පවතී නම්, එවැනි විටෙක සිංහල මාධ්‍ය නිවේදනය අනුව කටයුතු කළ යුතුය.

ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
උතුරු මැද පළාත.
2018.11.26

**වෙබ් අඩවිය : www. psc. nc. gov. lk**
**ෆැක්ස් අංකය: 025-2224447**